# ඇබෑර්තු

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## (සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමකි)

## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

සමාගමේ පවතින පහත සඳහන් ඇබෑර්තුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - පරිපාලන (HM 1-1) - තනතුරු 01 යි (කොන්ත්‍රාත් පදනම මත)

**1.1 සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2) :**

**බාහිර :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (Master's) හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

**සහ**

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2) :**

**අභ්‍යන්තර :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර වර්ගීකරණයේ (MM) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**1.2 වැටුප් පරිමාණය :** HM 1-1-2025 රු. [140,640-15 X 4,100-202,140]

**වැටුප :**

01/2025 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛයට අනුව 2026.01.01 දිනට වැටුප රු. 123,019.00 වේ.

**1.3 වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**සෑම අයදුම්කරුවෙකුම :**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරේ කර්තව්‍යයන් මනාව ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**රැකියා විස්තරය**

i. පරිපාලන කාර්ය මණ්ඩලයට මාර්ගෝපදේශනය සැපයීම ඇතුළුව, සියලුම මානව සම්පත් කටයුතු සහ ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම, සංවිධානය කිරීම සහ කළමනාකරණය කිරීම.
ii. වාර්ෂික සහ දිගුකාලීන ඉලක්ක, අරමුණු සහ වැඩ සැලසුම් සකස් කිරීම සඳහා සාමාන්‍යාධිකාරීවරයා සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
iii. රැස්වීම්, සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් ඇතුළු කාර්යාලීය උත්සව/වැඩසටහන් සැලසුම් කිරීම, කාලසටහන්ගත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
iv. සාමාන්‍යාධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ සම්පත් භාවිතය සැලසුම් කිරීම.
v. කාර්ය මණ්ඩලයේ කාර්යසාධන ඇගයීම සිදු කිරීම සහ සියලුම ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සඳහා වන දේශීය හා විදේශීය පුහුණු කිරීම්වලට අදාළ සියලු කටයුතු මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම.
vi. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, විගණන කමිටු රැස්වීම්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) රැස්වීම් සහ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම්වලට අදාළ ලේඛන සූදානම් කිරීම, සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
vii. ප්‍රධාන කාර්යාලයේ භෞතික සම්පත් කළමනාකරණය කිරීම.
viii. අලෙවිකරණ අංශවල කෙටිකාලීන සහ දිගුකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා අලෙවිකරණ කාර්ය මණ්ඩලය සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයවීම.
ix. සේවකයින් බඳවා ගැනීම, පුහුණු කිරීම, කාර්යසාධන කළමනාකරණය, උසස්වීම් ලබා දීම, මෙහෙයවීම සහ විනය පියවර ගැනීම.
x. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා අවශ්‍ය වාර්තා අවස්ථාවෝචිතව ඉදිරිපත් කිරීම සහ සාමාන්‍යාධිකාරීවරයා හෝ සභාපතිවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම කාර්යයක් ඉටු කිරීම.

මිනිරන් සහ ඒ ආශ්‍රිත කර්මාන්තවල හෝ නිෂ්පාදන කර්මාන්තවල පළපුරුද්ද සහ පෞද්ගලික අංශයේ සමාන තනතුරක පළපුරුද්ද තිබීම විශේෂ සැලකිල්ලක් දක්වා සලකා බලනු ලැබේ.

දැනටමත් රජයේ සේවයේ / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ**

1. සේවකයා විසින් 10% ක සහ සේවායෝජකයා විසින් 15% ක (සේවක භාරකාර අරමුදල - E.T.F. සඳහා 3% ක් ද ඇතුළුව) අර්ථ සාධක අරමුදල් දායකත්වය, ජීවන වියදම් දීමනා, ගමන් දීමනා සහ රජයේ චක්‍රලේඛවලට අනුව වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් හිමි වේ. තවද දෛනික පැමිණීම මත පදනම් වූ මාසික ආහාර දීමනාව, සේවක රක්ෂණ ක්‍රමය සහ නිෂ්පාදනය මත පදනම් වූ දිරි දීමනා ක්‍රමයද හිමි වේ.
2. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල අපේක්ෂකයින්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතුය.
3. කරුණාකර සහතිකවල පිටපත් සමඟ ඔබේ අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් 2026.09.15 දින හෝ ඊට පෙර පහත ලිපිනයට යොමු කරන්න. තනතුරේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කරන්න.

**සභාපති,**
**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්,**
**561/3, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.**

Gazette.lk
SINCE 2014
AMBITIONS REALIZED